**සීතා  අයදින්නෙ අපි දැං ඔබේ වදනයි! (ගීතය)**

සීතා…..

A) අයදින්නෙ අපි දැං ඔබේ වදනයි
අසා ඇත්තේ අප මෙතෙක් කල් උන් කියූ කථාවයි

සරණ දුන් පියාණන් ඔබ
කුමරෙකුට
ඔවාදුණි දුන්න සේ මුදුවන්න යැයි
ඔහු දෑත මත
දෑත මත//

B) ආ  ද ර් ශ වත්    දුවණියකි ඔබ
බැතිසිතින්      හිස නමා….
කුලගෙයින්     නික්ම ගිය...

C) සමිදු සමගින් නුඹත් ගත්තේ පිටුවහල් මාවතයි
වනගතව හිඳ වින්ද දුක් අපමණයි
අතවරින් පීඩිත ව ගොදුරක්ව හුන්නේ ඔබයි
සොයා උන් ඔබ ව යළි
අග්නියට බිළිකළ වගයි

D) දූෂිත ය කියා ඔබ...
අග්නියෙන් දවා පිරිසිද බලන්නට...
සමිදු අණ කළ වගයි...

E) ගොදුරක්ය.. නුඹ... දෙදෙනෙකුට ගොදුරු වූ....

F) අනුන් අතවරින් ගෙනගිය
සමිදු යළි දවා නුඹ පතිවත සෙවූ

G) ගොදුරක්ය.. නුඹ... දෙදෙනෙකුට ගොදුරු වූ....

~~සීතා…..~~
H) අයදින්නෙ අපි දැං ඔබේ වදනයි
අසා ඇත්තේ අප මෙතෙක් කල් උන් කියූ කථාවයි

I) ආ  ද ර් ශ වත්   බිරිඳක්ය ඔබ....

විමසුමින් තොර ව නිහඬව....
සමිඳු ගත් මගට ඉඩ හළ...

~~සීතා.....~~

J) අයදින්නෙ අපි දැං ඔබේ වදනයි
අසා ඇත්තේ අප මෙතෙක් කල් උන් කියූ කථාවයි

K) ලියූ කිවිඳුන් නුඹ ගැන කීය මේ ලෙස
ගැහැනිය නොවටියි සවන් යොමනට
පෙලුමටය නිසි ඇය තිරිසනකු විලසින්
එවන් සිතකින් උපන් කවිකම්
තුළින් නොපතමු ගැහැනියක වරුණක්

L) නමුත් ලොව අසා ඇත්තේ මෙතෙක් කල්
උන් කියූ කථාවයි

M) උන් නැමූ දුනු ගැන මිසක
නුඹ දැරූ මහ බරැති
ජීවිත දුන්න ගැන නොවෙයි

N) මිහිකත පවා ගුණකදින් නුඹ
සලිත කළ බව නොවෙයි

O) ඉතින් කිව මැනව අපට නිහඬ කළ'යුරු උන් ඔබ ව

P) සීතා, අයදින්නෙ අපි දැං ඔබේ වදනයි?

- බිනා අගර්වාල්ගේ Sita Speak නම් පැදිය ඇසුරින් ලියැවුණු ගීතයකි.

අනුවාදය සචින්ත මදූෂාන් විසිනි.

**තිර රචනය සහ වෙනත් උපදෙස්**

ගායනය එක් තනි ගායකයකු හෝ ගායිකාවකගෙන් නොව ගැහැණු පිරිමි සම සමව සිටින ගායන වෘන්දයකින් සිදුවිය යුතු ය. රූප රචනය තුළ ඔවුන් දිස් නොවිය යුතු ය. නමුත් ගීතය අවසන් වන අවස්ථාවේ (O හා P පද්‍ය ඛණ්ඩ දෙකේ දී) දී ග්‍රීක නාට්‍යවල වෘදක කණ්ඩායම පාත්‍රයා සමග මැදිහත් වන ආකාරයක සම්මුඛ වීමක් සිදු වේ. මක්නිසාද යත් ඔවුන් ඒ පද සීතාට ආයාචිත අණක් ලෙසින් (කියපං අරුන්ට දැන්වත් ඇත්ත කියල ඔඩියනස් එක පෙන්නල කියන්න වගේ) පවසන බැවිනි. එහි දී ඔවුන් ද රූප රචනාවට හසු වේ.

මැදට අනුඡේදනය (indent) කර ඇති පද්‍ය ඛණ්ඩ (A,C,F,H,J,K,L,M,N) වේගවත් ස්වරයකින් (සිසු විරු සමරු ගීතයේ - ළපලු අගින් ගිනි පබලු කඳුළු සලනා ... ශෛලියට සමාන වූ ශෛලියකින්) ද එසේ මැදට කිරීමෙන් තොර ව වම්පස කෙළවරින් ම අරඹා ඇති පද්‍ය ඛණ්ඩ සංගීතය නිහඬ වූ හෝ නිහඬතාව බහුල උචිත ස්වරූපයක කිංකිණි නාදයක් වැනි සරල හඬක් පමණක් රටාවකට නදවන හඬ පරිසරයක් තුළ නිතර දකින ගීතයක විනෝදවත් ගායනාවක් ලෙසින් නොව, රිද්මයානුකූල ප්‍රකාශනයක් ලෙසින් ~~(නන්දා මාලිනියගේ පවන ප්‍රසංගයේ උපාසකම්මා ඉපදුණු හීන කුලේ ගීතයේ වේගවත් නොවූ ස්වරයෙන් ගායනා කරන පද්‍ය ඛණ්ඩවලට සමාන ශෛලියකින්)~~ ගායනා විය යුතු ය.

ආරම්භයෙ එන සීතා... යන්න කෑගසා කරන ආමන්ත්‍රණයක් ලෙසින් කියවිය යුතු ය. සංගීතය හා ගායනය ඇරඹෙන්නේ එයින් පසුව ය. හුදෙක් ඩිස්ටෝපියානු පරිසරයක හෝ මදක් කාන්තාරරූපී පරිසරයක (රූපය බලන්න) හෝ පරිගණකමය සුදු පසුබිමක (Matrix සිනමා කෘතියේ මෝර්ෆියස් හා නියෝ පුහුණු පරිගණක ක්‍රීඩාව තුළට ඇතුලු වූ විගස ඇති පරිසරය මෙන්) හුදකලාව සිටින සීතා එයින් තිගැස්සී බලයි.

නමුත් එයට ද පෙර අවසානයට දක්වා ඇති ආකාරයේ නාට්‍යමය පූර්ව ජවනිකාවක් අන්තර්ගත වීම සුදුසු යැයි හැගේ. ඒ සිංහල ප්‍රේක්ෂකයාගේ විඥාණය තුළ මෙහි C,D,E,F,G පද්‍ය ඛණ්ඩවලට මුල් වූ සහ එහෙයින් ම මෙහි සංවේදීකරනයේ සහ මතවාදී ඛණ්ඩනයේ තීරණාත්මක අර්ථගැන්වීම රදා පවතින අගිනි පරීක්ෂාව පිළිබද රාමායණ ජවනිකාව රැදී නැති බැවින් එය පෙන්වා උචිත පූර්ව දැනුම ලබාදීම අප යුතුකම බැවිනි. නමුත් සුදුසු යැයි සිතන වෙනත් තැනකට වුව ද (මාගේ අවසරය ද ඇති ව) මෙය ඇතුලු කිරීමට ඔබට පුලුවන. නිදසුන් ලෙස D,E,F පද්‍ය ඛණ්ඩවලට අනුරූප රූප රචනය ලෙස එක්කළ හැකි ය. (මෙය තිර රචනයක ස්වරූපයෙන් ලියා නැත්තේ අතරමග නතර කළ කෙටිකතාවකින් පිටපත් කළ බැවිනි. එ බැවින් අනවශ්‍ය යැයි සිතෙන කොටස් කපා දමා ඇත. මේ සිද්ධිය ඇසුරින් අදාල සුදුසු පරිදි පිටපත සකසා ගන්න. )

> රාම සංසුන් ව එහෙත් අභිමානවත් බැල්මෙන් යුතු ව බලා හුන්නේ ය. ජයග්‍රාහී සගයෝ ඔහු සමගින් වූහ. ~~සීතා සිය දෙනෙත් විවර කර අවට විපරම් කළේ දැඩි අවිශ්වාසයකින් යුතු ව ය. ඇය ඕනැවටත් වඩා බලාපොරොත්තු කඩකරගෙන~~

~~තිබිණි. යහපත් ප්‍රාර්ථනා යනු සිහිනයන් පමණක් බැව් සංග්‍රාම සමයේ ඇය රැකීමට හුන් අය කී තොරතුරු වලින් ඇ පසක් කරගෙන සිටියා ය.~~

~~යථාර්ථයට නෙත් හැරීම ශෝකයට මුහුණදීම වූ හෙයින් ඇ ඒවා විවර කළේ දැඩි අවිශ්වාසයකිනි.~~

මියගිය බවට අසන්නට ලැබුණු රාම මද සිනහවකින් ... අනුකම්පා සහගත සිනහවකින් යුතු ව ඇත සිට ඇ දෙස බලා සිටී. (ඔහුගේ මුහුණේ ඇති බැල්ම හරියට ම කිවහොත් දරුවකුට රහසේ තෑග්ගක් තබා ඔහු අවදි වන තෙක් සිනාමුසු ව බලා ඉන්නා පියකුගේ වැන්න.)

~~නමුත් ඇ තවදුරටත් මායාවන්ට නො රැවටුණා ය. දැඩි අපේක්ෂාභංගත්වයකට; පළා යා නොහෙන අභග්ගයකට මුහුණ දෙන විට පියවි මායාවන්ට නිතර ගොදුරු වීම ඇ නිරන්තර ව අත්විඳ සිටියා ය. කෙතරම් අත්විඳ සිටියේද යත් රාම දකින හැම මොහොතක ම ඒ සිහිනයක් බව ඇ දැනසිටියා ය.~~

~~නමුත් අද දකින සිහිනයේ වෙනසක් තිබිණ. ... රාම සමග සිටින ඒ වානර මිනිසුන්... මීට පෙර දුටු සිහිනවල ඔවුන් නොවී ය. ඒ හැමකක ම රාම ඇය කරා පැමිණියේ රහසේ ය. විටක ඔහු උමගකින් ඇ ගලවාගැනීමට පැමිණ සිටියේ ය. එවිට ඇ පඳුරු ගොන්නක් සිපගෙන තිබුණි. තමා සිහිනයක් දුටු බව වටහා ගන්නා ඇය රාම උමං විවරය තුළ සිනාසෙමින් ඉන්නා අයුරු යළිදු දුටුවා ය. නිහඬ වන ලෙස ඇයට සංඥා කළ ඔහු ඇයට වහා උමං විවරයට බසින ලෙස පැවසුවේ ය. නැත ඉඟි කළේ ය. (කිසිම සිහිනයක ඇය ඔහුගේ හඬ ඇසුවේ නැත.) වරදක් සිදුකළ එකියක මෙන් බැගෑපත් ව හිස පහතට නවාගත් ඇ සංසුන් ව ප්‍රවේසම්කාරී ව උමං මගට පා තැබුවා ය. සමතල පොළව මත ඇගේ දෙපා නතර විණ! තවත් සිහිනයකින් ඇය අවදි ව සිටියා ය.~~

ප්‍රීතිය දනවනසුලු සිහින් සෝෂාවක් ඇගේ සවනට දැනේ. ඒ සුළඟ විය යුතු ය. ඇ සිතුවේ එසේ ය. එහෙත් එය කෙමෙන් පැහැදිලි වේ. ඇගේ දෙනෙතේ මද විමසිල්ලක් සටහන් වී යළි මැකී ගියේ ය. එය යළි මතුවිය. තමා අසළ පතිත වන දිගු සෙවනැල්ලත් සූර්ය දිශාවත් ඇ ප්‍රවේසම්කාරී ව විමසිලි කළා ය. ඇ මද පියවරක් තැබුවා ය. තම සෙවනැල්ල එහි ගැටෙන බව දුටුවා ය. මොහොතක් කල්පනා කළා ය.

ඇ වඩාත් නුවණැති ප්‍රතික්‍රියාවක් තෝරා ගත්තී ය. දමාගෙන හුන් උතුරු සළුව සුරතට ගත්තී ය. සුපරීක්ෂාකාරී තියුණු බැල්මක් හෙළුවා ය. .....

.......................................................................................

...........................................................................................

සෙනග දෙසට පාව යන උතුරු සළුව දෙස බලා හුන්නා ය. රාම සැනින් එය දැතෙහි ගුලිකරගත්තේ සිනා පෑ බවත් එතෙක් ඔහු සමග හුන් සෙනග කුතුහලයෙන් බලා හුන් බවත් සටහන් කර ගත්තා ය. මද දුරක් ගිය ඇ රාම වෙත සිනහවක් හෙළුවා ය. ඔහු යළි එය ඇ දෙසට විසි කළේ ය. එය ඇයට මදක් නුදුරින් පතිත විණි.

**ප්‍රාණවත් සිනහවෙන් යුතු ව ඇ දිව එයි.**

**......................................................................................**

**...............................................................................................**

**ඇගේ දෑත් ඔහු මුහුණට ළංවත් ම ඔහු ඇ නතර කර සියතෙහි සිරකරගත්තේ ය. ඇ ආදරණීය ව ඔහු දෙස බැලුවා ය. නමුත් ඔහුගේ මුහුණේ ඇත්තේ කල්පනාකාරී බවකි. ඇය මදක් විමතියට පත් වූවා ය. නැවත ප්‍රේමණීය ව සිනාසුණා ය. ඔහුගේ කල්පනාකාරී බව නැති විය. ඒ වෙනුවට නුරුස්නාවක් සටහන් විය.**

***බොහෝ කලක් කුලගෙයින් පිටත සිටි අයෙකු නැවත කුලගෙට කැන්දා ගැනීම අපගේ සිරිත නොවේ.***